

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## ගල් ගේ දෙයියො එනු මගෙ වාහේ එක්කා

"අහවල් එකක්ද මාමා පන්දම් මාරුව කියන්නෙ..?"

"පය ඉක්මන් කර.. අපේ එකාලා වෑ ඉස්මත්තට ලං කරලත් ඇති.. තට දෑහින් දකින්ට හැක.."

වෑ ඉස්මත්තට ලං වෙනකොටම හේන් ඉම එකාලා එතනසේරම පොදි ගැහිලා. උන බම්බු වලට කැකුණ තෙල් පුරවා රෙදි පාන්කඩයක් බම්බුවේ කටට හිර කර මනාව තනා ගත් පන්දම් අතැතිව සිටි ඔවුන් කරන්නට යන්නේ කුමක්දැයි දැනගැන්නා තුරු මට ඉස්පාසුවක් නැතුවා.

"බණ්ඩිරාල මාමා.. උඹවත් කියාපන් මොකෑ කේන්ට තනන්නෙ..? "

"අහවල් එකටයෑ කොයින්රාලේ මාලයණ්ඩිව මූකලානේ රෑ තිස්සේ දොක්කාන ආවේ..?"
"අඩා මුත්තප්පා.. ඒකටත් දැනකියාගන්ට නොවෑ පන්දම් මාරුව මොකෑ කියා.."

"මේ අහ මලයා.. "
"කියපන් මුත්තප්පා "

"අපි හේන් මුර කරන්නෙ මේ විදිහට.. සේරම කැලේ දෙයියන්ට කොල අතු එල්ලලලා පොල් ගහලා ගතු කියලා හේන් වලට යනවා.. ඉත්තේරුවෙම්ම පටන් ගන්නෙ කබරගල පාමුන හේනෙන්.. එතනින් දෙපොලක් ගමන් ගසනවා ගිණිහුළ ඉහට උඩින් අල්ලාගෙන.. පස්සෙන් පහු අපි බහිරවයා ගිල්ල දිය වල පහු කරලා ගොඹිරාගෙ හේනට කිට්ටු කරනවා.. ඒකා හේන් ඉම ඉන්නවා ගිනි හුළ අත ගන්ට.. එතන ටිකිරා මලයා නවත්තලා මං ගොම්රා එක්ක රෑටනවා කරත්තරාළගෙ හේන් ඉමට.. මං එතන හිට උං රෑටනවා බමුනුගොල්ලෙ රාළගෙ හේනට.. ඔය විදිහට ඇකුබ්බා බුග් ගහනකල් හේවටේ යනවා.. එකෙක් නිදි නැතුවා.. පද පේලි දිගේලි කර කර ගිනිමැල ලඟ ගිනි හුළ අතගන්ට වැට ඉම දිහාට ඇස් ගෙඩි උලුප්පාගෙන ඉන්නවා.. බෝ තේරුං ගත්තැයි මලයා..?"

"ඉතින් මාත් එක්කහු කරගනිල්ලා හේන් වටේ යන්ට.. මුත්තප්පා මාමා මටත් දියන් මීතලා පොතු ටිකක් හපන්ට.."
"ඒවා නොහප.. ඉහ කැරකිල්ල එයි තට.."

"බණ්ඩිරාලේ බුලත් පුවක් ටිකක් විතරක් දී අපේ මලයට.. "
"ඕං බල බණ්ඩිරාලේ හැබෑ බොරු මලයා උඹේ හේන් ඉමෙන් එයාට පය උස්සන්නෙ නෑ.. "

"අර මොකෑ මුත්තප්පා.?"
"අඩා මලී නගත් අද හේනට ඇවිත්.. "

කොයින් මාමා මා දිහා බලලා ඔලොක්කුවට වගේ හෙහ් හෙහ් ගාලා හිනා කොරේ මම මලී නගා හේනට එන බව දැනගෙන උන්දෑ පස්සෙන් පන්දම් මාරුවට යන්ට ආවයි කියලා හිතාගෙන වෙන්ටෑ.
"හා.. හා. යමව් හේන්වලට.."

"අඩා මුත්තප්පා උඹ මලයා එකක් පල මැදිකොරාන.. ඒකට සතා සරුපයා ගැන තේරුම් නැතුවා.. බො ඉස්සර වෙය ගිනිබටෙත් අරගෙන.. ඊට පහු පලයා.. ඊට පහු රත්තා පිටිපස්සෙන් එන්ට කිය.."

"කොයින් රාලේ.. බයගන්ට කාරි නැතුවා. මලයා මගේ පණ ගානයි.."
"අඩා රත්තා අයියණ්ඩි.. පද පේලි අඬ තලනවා එමට.."

"එහෙම තමයි මලයා.. එකෙක් දිගේලි කොරාම අනිකා ඒකෙ රිස්ස අරිනවා.. හ්න් කෙරුවාවෙ හැටි ඔහොමයි.. ඕං අඩා අපි මලී නගාගෙ හේන් ඉමට කිට්ටු කළා.. හොඳට කන දී... මලිති නගාගෙ ගෙජ්ජි හෙලවිල්ල ... "

ඒකි අපූරුවට මේ පද පේලි දිගේලි කළා.

*එකගේ දීග කෑවත් දෙන්නෙක් එක්කා*
*මා ගේ තනිව දා දෙන්නම පැල් රැක්කා*
*දීගේ ඇරුණ ලෙස ඉගි ගැහිලා වක්කා*
*ගල් ගේ දෙයියො එනු මගෙ වාහේ එක්කා*

බන්ඩි රාළ මාමා අතට පන්දම මාරු කරන ගමන් මුත්තප්පා මාමා මෙහෙම කිව්වා.

"අඩී තිගෙ වාහෙ මේං හේන් ඉම.. ගල්ගේ දෙයියො නොව බොල කැකුණගාලෙ මුත්තප්පා තිගෙ වාහෙ කැටුව ආවෙ.."

"අඩා රත්තා තෝ එලියෙ ගිනි මැලේ බෝ කර මලයා පැලට කරලා.."

"යම රාලෙ අපි.. කෙලී මහතැනට බෙලි මල් රත්කරපුවා ඇති.. පැණිකපුත් එක්ක දිය.. මහතැන් තනිපංගලමේ වැට ඉමට නොයව.." බණ්ඩිරාල මාමා දුවට පැවසුවේ මගේ හිස අතගාමින් මහා ලෙන්ගතු කමකින්. "..උඹල කැලේ දෙයියෝ රකිනවා.. හා යම.." කියමින් මුත්තප්පා සමග ගමන් ගස්සන්නට විය.

ගිනි හුළ පෙනෙන තුරාවට හිඳ අපි පැල ඇතුලට වැදුණෝ රත්තයියා කීමට.

"බොලා ඇතුලට වෙලා ඉඳු.. මං හතරවට ඇස්ගෙඩි උලුල්පාන ඉන්නම්..

"හොඳා අයියණ්ඩි.."

බෝගල


YSL

Migration Services

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956
0430 359 006

(Close to Latrobe university , RMIT and NMIT)
6 Mat Rush Avenue, Bundoora, VIC 3083
Tel: 03 9467 4468
yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA